**විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය :- 11**

**වාරය :- 02**

**ඒකකය :- විභක්ති**

**ඉගෙනුම් පල**

- විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

## ක්‍රියාකාරකම ii

1. වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i. නාමය විවිධ අර්ථවලට බෙදනුයේ විභක්ති ය.
   ii. විභක්ති යනු ප්‍රකෘති ප්‍රත්‍යය සඳහා යෙදෙන වෙනත් නාමයකි.
   iii. විභක්ති සංඛ්‍යාව 10 කි.
   iv. විභක්ති යනු පද විශේෂයකි.

2. විභක්ති අනුපිළිවෙළින් දක්වන්න.

| 01 | ප්‍රථමා විභක්තිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

3. වාක්‍යයක ප්‍රථමා විභක්තියෙන් යෙදෙන පදය හඳුන්වන්නේ,

   i. කර්තෘ පදය කියා ය.
   ii. කර්ම පදය කියා ය.
   iii. උක්ත පදය කියා ය.
   iv. අනුක්ත පදය කියා ය.

4. වාක්‍යයක උක්තය ලෙස යෙදෙන්නේ,

   i. කර්තෘ හා කර්ම පදයි.
   ii. කරණ හා කර්තෘ පදයි.
   iii. ප්‍රථමා හා සම්ප්‍රදානාර්ථ පදයි.
   iv. අවධි හා ආධාරාර්ථ පදයි.

5. පහත සඳහන් පදවල ප්‍රථමා  විභක්ති බහු වචන පද ලියන්න.

i. ගොවියා - ---------------------------
ii. කවියා ---------------------------
iii. මම ---------------------------
iv. තෝ ---------------------------
v. ළමයා ---------------------------
vi. වෘක්ෂය ---------------------------

6. පහත සඳහන් වාක්‍යවල ප්‍රථමා විභක්ති රූපය යටින් ඉරක් අඳින්න.

i. කම්කරුවෝ පාරේ වැඩ කරති.
ii. වෛද්‍යවරයා විසින් රෝගීහු පරීක්ෂා කෙරෙති.
iii. සැඩ සුළඟ ගස්වල අතු ද, නිවෙස්වල වහළවල් ද රැගෙන ගියේ ය.
iv. වැද්දා විසින් ගිරවා ද කුඩුව ද ප්‍රපාතයට හෙළෙති.
v. යුද්ධය මිනිසුන්ට දේපළ පමණක් නො ව ජීවිත ද අහිමි කළේ ය.

## ක්‍රියාකාරකම ii

1.පහත සඳහන් වගුව නිවැරදි ව සම්පූර්ණ කරන්න.

| ව්‍යාකරණාර්ථය | විභක්තිය |
|---|---|
| යමක් ලබන්නා හෙවත් ප්‍රතිග්‍රාහකයා හඟවන පදය | |
| සමීපයෙහි සිට අමතන විට ඇමතුම් ලබන්නා හඟවන පදය | උදා:- ආලපන විභක්තිය |
| යම් දෙයක, යම් කෙනෙකුගේ අයිතිය, ස්වාමිත්වය, හිමිකම හෝ සම්බන්ධය දක්වන පදය | |
| අනුක්ත කර්තෘ හඟවන පදය | |
| සීමාවක්, වෙන් වීමක්, පහ වීමක් හඟවන පදය | |
| අනුක්ත කර්මාර්ථය හඟවන පදය | |
| උක්තාර්ථය ප්‍රකාශ කරන පදය | |
| කර්තෘගේ ක්‍රියාවට උපකාරී වන පදය | |
| යම් දෙයක් පැවැත්මට හෝ දරා ගැනීමට ආධාර වන පදය | |

2. පහත සඳහන් පදවල ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

i. ගසෙන් --------------------------
ii. වනයෙහි --------------------------
iii. යාචකයාට --------------------------
iv. ගැමියෝ --------------------------
v. වස්සන් --------------------------
vi. සේවකයාගේ --------------------------
vii. පයින් --------------------------

viii. සිංහලයිනි ---------------------------

3. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කර්මය සෑම විට ම කර්ම විභක්තියෙන් තැබිය යුතු ය.
ii. අනුක්ත කර්මය ප්‍රථමාවෙන් සිටියි.
iii. උක්ත කර්මය කර්ම විභක්තියෙන් තැබිය යුතු ය.
iv. කර්මය අනුක්ත අවස්ථාවේ කර්මයෙන් ද, උක්ත අවස්ථාවේ ප්‍රථමාවෙන් ද සිටියි.

4. පහත සඳහන් පදවල කර්ම විභක්ති බහු වචන රූප ලියන්න.

i. වනිතාව -------------------------------------
ii. රිතීහු ------------------------------------
iii. ගංගාවෝ ---------------------------------
iv. ශිෂ්‍යයා -------------------------------------
v. බසය ------------------------------------

5. පහත සඳහන් වාක්‍යවල යෙදී ඇති කර්ම විභක්ති පද උපුටා දක්වන්න.

i. වෙළෙන්දෝ පාරිභෝගිකයන් රවටති.
ii. ධීවරයා බෝට්ටුව දියඹට දියත් කළේ ය.
iii. ඈ දෙව්ලියක මෙන් සැරසී විවාහෝත්සවයට පැමිණියා ය.
iv. උකටලී භික්ෂුව බුදුන් කරා යොමු කරන ලදි.
v. ඇදුරුතුමා මා පැසසුවේ ය.

## ක්‍රියාකාරකම iii

1. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කර්තෘ පදය සෑම විට ම උක්තව සිටියි.
ii. උක්ත කර්තෘ ප්‍රථමාවෙන් ද, අනුක්ත කර්තෘ කර්තෘ විභක්තියෙන් ද සිටියි.
iii. කර්තෘ අනුක්ත අවස්ථාවේ කර්මය බවට පත් වෙයි.
iv. කර්තෘ පද අනුක්ත කිරීමට සිදු කළ යුත්තේ ඒ අගට විසින් නිපාතය යෙදීම පමණි.

2. පහත දැක්වෙන උක්ත කර්තෘ පදවල අනුක්ත රූප ලියන්න.

i. නිවේදිකාවක් -------------------------------
ii. තෝ -------------------------------
iii. ග්‍රන්ථයෝ -------------------------------
iv. කම්කරුවා -------------------------------
v. නළුවෙක් -------------------------------

3. වරහන් තුළ දී ඇති පද සුදුසු පරිදි සකස් කොට හිස් තැනට යොදන්න.

i. --------------- අකුරු ලියනු ලැබෙයි (ළමයා)
ii. --------------- අගහරු ලෝකයේ ජීවය පිළිබඳ පර්යෙෂණ කෙරෙයි.(විද්‍යාඥයෝ)
iii. --------------- මල් නෙළන ලදි. (දැරියක්)
iv. --------------- දරුවෝ රැක බලා ගැනෙති. (මවුපියෝ)
v. --------------- හේන වැනසෙයි. (ඌරෝ)

4. පහත සඳහන් වාක්‍යවල අංකිත පදයන්හි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කරන්න.

i. වඩුවා දැවයෙන් ගෘහෝපකරණ සාදයි.
ii. අම්මා හැන්දෙන් හොද්ද කාල් ගායි.
iii. මම පයින් ඇවිදගෙන යමි.
iv. දැනුමෙන් ජීවිතය අර්ථවත් වෙයි.
v. සුළඟින් ගස්වැල් ඉදිරෙයි.

5. පහත දැක්වෙන පදවලින් කරණ විභක්ති රූප සාදා ඒවා යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

i. ආහාර
ii. වස්ත්‍ර
iii. දූරකථනය
iv. සැරයටිය
v. බලය

## ක්‍රියාකාරකම iv

1. පහත සඳහන් වාක්‍යවල ඇතුළත් සම්ප්‍රදාන විභක්ති පද නම් කරන්න.

i. කාරුණික තැනැත්තා යාචකයාට ආහාර දෙයි.
ii. ගුරුවරු සිසුන්ට අවවාද දෙති.
iii. ඇතැම් අහිංසක සතුන් මස් පිණිස විකිණෙයි.
iv. හොඳ ම දේ දරුවන් සඳහා ය.
v. සභාවේ සියල්ලෝ කථිකයාට ප්‍රසාදය පළ කළහ.

2. පහත සඳහන් පද යොදා වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.

i. මහාජනයාට
ii. ධීවරයන් සඳහා
iii. කම්කරුවන්ට
iv. වස්ත්‍ර පිණිස
v. ලේඛකයින්ට

3. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කර්තෘගේ ක්‍රියාවට උපකාර වන දෙය හඳුන්වන පදය අවධි විභක්තියෙන් තැබෙයි.
ii. ක්‍රියාවක පූර්ව සීමාව දක්වන පදය අවධි විභක්ති වෙයි.

iii. 'එන්, ඉන්' ප්‍රත්‍ය අවධි විභක්ති රූපවල පමණක් යෙදෙයි.
iv. අවධි විභක්ති හා කරණ විභක්ති රූප අතර අර්ථමය වෙනසක් නො මැත.

4. පහත වාක්‍යවල ඇති අවධි විභක්ති පද උපුටා දක්වන්න.

i. මුහුදෙන් සුළං හමයි.
ii. පොල් ගසෙන් ගෙඩියක් බිමට වැටෙයි.
iii. හිරුගෙන් සඳ දුරස් වෙයි.
iv. සිංහයා ගුහාවෙන් නික්මෙයි.
v. ළමයි පස්වරු 1.30 ට පාසලෙන් පිටවෙයි.

5. දී ඇති වාක්‍යවල සම්බන්ධ විභක්ති රූප යටින් ඉරි අඳින්න.

i. කොවුලාගේ මිහිරි නාදය අවුරුදු සිරිය සිතට දනවයි.
ii. ඔහු පුටුවේ ඇන්දට බර වී සිටියේ ය.
iii. මල්වල පෙති සුළඟට ගැලවෙයි.
iv. ගඟේ ඉවුරු දිය පහරට සේදෙයි.
v. අපේ වත්ත එල දරන ගස්වලින් පිරී ඇත.

6. ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කර දක්වන්න.

i. උදෑල්ලේ
ii. රෝගියාගේ
iii. එළුවන්ගේ
iv. වනයේ
v. ඇයගේ

## ක්‍රියාකාරකම V

1. දී ඇති වාක්‍යවල ඇතුළත් ආධාර විභක්ති පද නම් කරන්න.

i. රාත්‍රියට වීථියෙහි දුබල එළියක් පැවතිණි.
ii. සත්තු වනයෙහි නිදහසේ හැසිරෙති.
iii. මිනිසුන් කෙරෙහි දයාව පවතී.
iv. මත්ස්‍යයෝ ගං දියේ පීනති.
v. බසෙහි රස හව් විඳින දනෝ දුලබ වෙති.

2. දී ඇති පද අතුරෙන් ආලපන විභක්ති පද පමණක් තෝරා ලියන්න.

සිංහලයිනි, පොතෙහි, දරුව, බලධරයිනි, පුතුනේ, දෙවියන්ගේ, රටවැසියන්ට, බිඟුනි, සේවකයෝ, සැරයටියෙන්

3. පහත සඳහන් ගද්‍ය පාඨයෙහි කළු අකුරෙන් දැක්වෙන පදවල විභක්ති නම් කරන්න.

''අම්මා දරුවා දෙස ආදරයෙන් බලා සිටියා ය. අනතුරු ව මව විසින් දරුවා සුරතල් කෙරිණි. මඳ වේලාවකින් මව දරුවාට කිරි පොවමින් නින්ද යන තුරු නැළවිලි ගී කීවා ය. දරුවා කරණ කොට අපරිමිත සතුටක් ලැබූ ඇ දරුවාගෙන් ඉවත් වී දරුවාගේ කාමරය පිරිසිදු කිරීමෙහි නියැළුණා ය. නින්දෙන් අවදි වූ දරුවා වටපිට බලා මව සිටිනු දැක සිනාසුණේ ය. දරුවා කෙරෙහි මහත් සෙනෙහසින් යුතු ව එතැනට පැමිණි මව 'දරුව, නුඹ නිසා මම යළි උපන්නෙමි' යනුවෙන් සෙමෙන් මිමිණුවා ය.

4.

| | පුරුෂ ලිංග | | ස්ත්‍රී ලිංග | | නපුංශක ලිංග | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| ප්‍රථමා | ආ/ඒ/ං/එක් | ඕ/හු/උ/ං/ලා | අ/ං | ඕ/හු/උ/ං/අක් | අ | ං/වල්/න් |
| කර්ම | ප්‍රථමා විභක්ති ප්‍රත්‍යය ම යෙදේ | අන්/උන්/ඉන් | | අන්/උන්/ඉන් | | |
| කර්තෘ | විසින් | විසින් | විසින් | විසින් | එන්/ඉන් | වලින් |
| කරණ | කරණකොට | කරණකොට | කරණකොට | කරණකොට | එන්/ඉන් | වලින් |
| සම්ප්‍රදාන | (අ)ට/ට | (අ)ට | | | (අ)ට | වලට |
| අවධි | ගෙන් | ගෙන්/කෙරෙන් | | | එන්/ඉන් | වලින් |
| සම්බන්ධ | ගේ | ගේ | | | ඒ/ඇ/එහි | වලැ/වල |
| අධාර | කෙරෙහි | කෙරෙහි | | | ඒ/ඇ/එහි | වලැ/වල |
| ආලපන | ං/අ/ඒ/ඕ/ඉ/ඒ | නි | | | | |

ඉහත වගුව උපකාරයට ගෙන 'ඇත්, කත්, අත්' යන ශබ්ද සියලු විභක්තිවල වරනගන්න.

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1- i

2

| | |
|---|---|
| 01 | ප්‍රථමා විභක්තිය |
| 02 | කර්ම විභක්තිය |
| 03 | කර්තෘ විභක්තිය |
| 04 | කරණ විභක්තිය |
| 05 | සම්ප්‍රදාන විභක්තිය |
| 06 | අවධි විභක්තිය |
| 07 | සම්බන්ධ විභක්තිය |
| 08 | ආධාර විභක්තිය |
| 09 | ආලපන විභක්තිය |

3- iii 4- i

5 ගොවියෝ, කවියෝ, අපි, තොපි, ළමයි, වෘක්ෂ/වෘක්ෂයෝ

6

i. කම්කරුවෝ
ii. රෝගීහු
iii. සැඩසුළඟ
iv. ගිරවා ද කුඩුව ද
v. යුද්ධය

### ක්‍රියාකාරකම ii

1 සම්ප්‍රදාන, සම්බන්ධ, කර්තෘ, අවධි, කර්ම, ප්‍රථමා, කරණ, ආධාර

2

i. ගස් + එන්
ii. වන+එහි
iii. යාචක+ආට
iv. ගැමි+ඕ
v. වසු+අන්
vi. සේවක+ආගේ
vii. පා+ඉන්
viii. සිංහල + ඉනි

3- iv

4

i. වනිතාවන්
ii. රීතීන්
iii. ගංගාවන්
iv. ශිෂ්‍යයන්
v. බස්

5

i. පාරිභෝගිකයන්
ii. බෝට්ටුව
iii. දෙව්ලියක/විවාහෝත්සවයට
iv. බුදුන්
v. මා

## ක්‍රියාකාරකම iii

1 -ii

2

i. නිවේදිකාවක විසින්
ii. තා විසින්
iii. ග්‍රන්ථයන් විසින්
iv. කම්කරුවන් විසින්
v. නළුවකු විසින්

3

vi. ළමයා විසින්
vii. විද්‍යාඥයන් විසින්
viii. දැරියක විසින්
ix. මවුපියන් විසින්
x. ඌරන් විසින්

4

i. දැව+එන්
ii. හැඳි+එන්
iii. පා+ඉන්
iv. දැනුම+එන්
v. සුළඟ+ඉන්

5

i. සියලු සත්ත්වයෝ ආහාරයෙන් යැපෙති.
ii. වස්ත්‍රයෙන් කෙරෙන මූලික කාර්යය විළි වසා ගැනීමයි.
iii. ඔහු මට දුරකථනයෙන් ඇමතුවේ ය.
iv. මහල්ලා සැරයටියෙන් වාරු ගෙන ඇවිදියි.
v. දේශපාලකයා බලයෙන් උමතු වෙයි.

## ක්‍රියාකාරකම iv

1

i. යාචකයාට
ii. සිසුන්ට
iii. මස් පිණිස
iv. දරුවන් සඳහා
v. කථිකයාට

2

i. ආණ්ඩුව වසංගතයෙන් අසරණ වූ ජනයාට ආධාර සපයයි.
ii. අමාත්‍යාංශය ධීවරයන් සඳහා දැල් ආම්පන්න පිරිනමයි.
iii. වතු හාම්පුත්තු කම්කරුවන්ට නියමිත වැටුප නො ගෙවති.
iv. සන්නාලියා වස්ත්‍ර පිණිස නූල් සාදයි.
v. දක්ෂ ලේඛකයින්ට සංස්කෘතික දෙපාර්තමේන්තුව සම්මාන පිරිනමයි.

3 - ii

4

i. මුහුදෙන්
ii. පොල් ගසෙන්
iii. හිරුගෙන්
iv. ගුහාවෙන්
v. පාසලෙන්

5

i. කොවුලාගේ
ii. පුටුවේ
iii. මල්වල
iv. ගඟේ
v. අපේ

6

i. උදලු+එන්
ii. රෝගී+ආගේ
iii. එළු+අන්ගේ

iv. වන+ඒ
v. ඇය+ගේ

## ක්‍රියාකාරකම v

1

i. වීරියෙහි
ii. වනයෙහි
iii. මිනිසුන් කෙරෙහි
iv. දියේ
v. බසෙහි

2 සිංහලයිනි, දරුව, බලධරයිනි, පුතුනේ, බිගුනි

3 ප්‍රථමා, කර්තෘ, ප්‍රථමා, සම්ප්‍රදාන, කරණ, අවධි, සම්බන්ධ, ප්‍රථමා, ආධාර, ආලපන

4

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | ඇතා | ඇත්තු |
| කර්ම | ඇතා | ඇතුන් |
| කර්තෘ | ඇතා විසින් | ඇතුන් විසින් |
| කරණ | ඇතා කරණ කොට | ඇතුන් කරණ කොට |
| සම්ප්‍රදාන | ඇතාට | ඇතුන්ට |
| අවධි | ඇතාගෙන් | ඇතුන්ගෙන් |
| සම්බන්ධ | ඇතාගේ | ඇතුන්ගේ |
| ආධාර | ඇතා කෙරෙහි | ඇතුන් කෙරෙහි |
| ආලපන | ඇතා | ඇතුනි |

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | කත | කත්තු |
| කර්ම | කත | කතුන් |
| කර්තෘ | කත විසින් | කතුන් විසින් |
| කරණ | කත කරණ කොට | කතුන් කරණ කොට |
| සම්ප්‍රදාන | කතට | කතුන්ට |
| අවධි | කතගෙන් | කතුන්ගෙන් |
| සම්බන්ධ | කතගේ | කතුන්ගේ |
| ආධාර | කත කෙරෙහි | කතුන් කෙරෙහි |
| ආලපන | කත | කතුනි |

| විභක්ති | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා | අත | අත් |
| කර්ම | අත | අත් |
| කර්තෘ | අතෙන් | අත්වලින් |
| කරණ | අතෙන් | අත්වලින් |
| සම්ප්‍රදාන | අතට | අත්වලට |
| අවධි | අතෙන් | අත්වලින් |
| සම්බන්ධ | අතේ | අත්වල |
| ආධාර | අතේ/අතෙහි | අත්වලැ |
| ආලපන | - | - |